# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2143/9 - 2019 සැප්තැම්බර් මස 30 වැනි සඳුදා - 2019.09.30**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මා විසින් (393 වන අධිකාරය වූ) පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 2 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාර 2019 ජනවාරි මස 16 වන දින අංක : 2106/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කෙරුණු නිවේදනයෙන් 2019 ජනවාරි මස 14 වන දින පිහිටුවන ලද 2015 ජනවාරි 15 දින සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ රජයේ ආයතනවල සිදුවී ඇතැයි සැලකෙන දූෂණ ක්‍රියා, වංචා, සාපරාධී ලෙස විශ්වාසය කඩකිරීම, දේපළ සාපරාධී ව්‍යාපහරණය, රැවටීම සහ බලය හෝ අධිකාරය, රාජ්‍ය සම්පත් හා වරප්‍රසාද අනිසි ලෙස පාවිච්චි කිරීම හෝ අවභාවිතය පිළිබඳව විමර්ශනය කිරීම සඳහා වූ පරීක්ෂණ කොමිෂන් සභාවේ තත් කාර්යයන් ඉටුකර එහි අවසන් වාර්තාව ඉදිරිපත් කළ යුතු වන්නා වූ 2019 ජූලි මස 14 වන දිනෙන් අවසන් වන මාස 06 කාලය, එකී පනතේ 4 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2019 ජූලි මස 15 වන දින අංක 2132/4 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනයක් මගින් 2019 ජූලි මස 14 වන දින සිට මාස දෙකහමාරකින් (2 1/2), එනම් 2019 සැප්තැම්බර් මස 30 දින දක්වා දීර්ඝ කරන ලදුව, නැවත වතාවක් එකී බලතල ප්‍රකාරවම 2019 ඔක්තෝබර් මස 31 දින දක්වා මෙයින් දීර්ඝ කරමි.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2019 සැප්තැම්බර් මස 26 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

10 - 523

1A - G 31145 — 387 (2019/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*